# දෙමළ අපේක්ෂා හා ජාතිය ගොඩනැගීම

දෙමළ අපේක්ෂා දෙකක් ගැන අපි කලින් සඳහන් කෙළෙමු. මේ අපේක්ෂා පළමුවෙන් ම තිබුණේ ඉංගිරිසින් විසින් ඇතිකරන ලද බොහෝ විට ඉංගිරිසි කතා කළ හැකි වූ දෙමළ මධ්‍යම පංතියට ය. ඉන් එකක් වූයේ දෙමළ නායකයන් මුළු රටටම නායකයන් වීම ය. ඒ බැරි බව තේරුම් ගිය පසු චෙල්වනායගම් ඊනියා අහිංසාවක් ගැන කතාකකරමින් උතුරු හා නැගෙනහිර පළාත් එක්කර වෙන ම දෙමළ රාජ්‍යයක් ගොඩනැගීමට හිංසාව මුල්කරගත් ක්‍රියා මාර්ගයකට දෙමළ ජනයා මෙහෙයවී ය. ජනතාව එකරාශි කරන ව්‍යාපාරවල ඇති අහිංසාවක් නැත. ජනතාවක් එකරාශි වූ විට ක්‍රියාකරන්නේ සමූහ විඥානයකින් මිස පුද්ගල විඥානයකින් නො වේ. සමූහ විඥානය ඊනියා නායකයන් වුව ද (නායකයන්ගේ විඥානය යහපත් යැයි සැළකුව ද) අභිබවා කටයුතු කරනු දැකිය හැකි ය. අහිංසාව පදනම් කරගත් ව්‍යාපාරයක යෙදෙන්නකුට ජනතාව එකරාශි කර ඊනියා සාමකාමී සටන්වලට ඔවුන් ගෙනගිය නො හැකි ය.

බුදුන්වහන්සේ ආළවක දමනයට හෝ අංගුලිමාල දමනයට හෝ වෙනත් එවැන්නකට හෝ භික්ෂූන්වහන්සේ පිරිවරා වැඩිය බවක් දැනගන්නට නැත. අඩුම වශයෙන් උන්වහන්සේ රහතන්වහන්සේ පවා ඒ සඳහා ඩැඩම කරවා නැත. ඒ රහතන්වහන්සේ අතින් සාමූහික ව වත් හිංසාවක් විය හැකි බැවින් නොව ඒ වැරදි පුර්වාදර්ශයක් සැපයිය හැකි ව තිබූ බැවින් යැයි සිතිය හැකි ය. ජනතාව එකරාශි කිරීම යනු හිංසාවට මුළ පිරීමකි. ගාන්ධිතුමා ජනතාව එකරාශි කෙළේ ය. එතුමාගේ ව්‍යාපාරය අහිංසා ව්‍යාපාරයක් යැයි බොහෝ දෙනා කෑමොර ගසන නමුත් එහි හිංසාව ගැබ් ව තිබුණා පමණක් නොව බොහෝ අවස්ථාවල ඉන් හිංසාව ජනිත විය. එසේ හිංසාව ජනිත වූ පසුවවත් ගාන්ධිතුමා ජනතාව එකරාශි කිරීම නැවැත්තුවේ නැත. ඇතැමුන් බුදුන්වහන්සේ හා ගාන්ධිතුමා සංසන්දනය කරන නමුත් ගාන්ධිතුමා අහිංසාවාදියකු ලෙස හැඳින්විය හැකි නො වේ. ලංකාවේ ව්‍යාජ ගාන්ධිලා වූ රාජ්‍ය නොවන බැළයන්, ජඩමාධ්‍යවේදීන් හා වෙනත් අය ගාන්ධිතුමා බුදුන්වහන්සේ සමග සංසන්දනය කරන්නේ යහපත් සිතින් නම් නො වේ.

ලංකාවේ ගාන්ධි ලෙස ඇතැමුන් විසින් හඳුන්වනු ලබන චෙල්වනායගම් කිසි දිනෙක අහිංසාවාදියෙක් නො වී ය. ඔහු දෙමළ ජනයා සිංහලයන්ට විරුද්ධව එකරාශිකර මෙහෙයවී ය. ඔහුගෙන් පසු අමිර්තලිංගම් වැනි නායකයෝ ද වෛරය වැපිරවූහ. ප්‍රභාකරන්ගේ සියළු කෘර වධහිංසාවලට මේ නායකයෝ ද වගකිවයුත්තෝ වෙති. ඉංගිරිසි කතාකළ දෙමළ නායකයෝ තමන්ගේ අපේක්ෂා මුදුන්පත් කරගැනීමට සාමාන්‍ය දෙමළ ජනයා, විශේෂයෙන් ම තරුණයන් උසිගැන්වූහ. අපි ප්‍රභාකරන්ගේ මස්සිනාලා බාප්පලා මෙන් ම සීයලා ද හඳුනාගත යුතු වෙමු.

එහෙත් සාමාන්‍ය දෙමළ ජනයාගේ සාධාරණ අපේක්ෂා නැතිවා නො වේ. උප්පැන්න සහතිකයක් දෙමළෙන් ලබාගැනීම, දෙමළ කතාකරන වැසියන් බහුතරය වූ පෙදෙසක පොලීසියට දෙමළෙන් පැමිණිල්ලක් කිරීම ආදිය ඒ අතර වෙයි. එවැනි අපේක්ෂා ඉටුකිරීමට රජය බැඳී සිටියි. ඒ අතර අමතක නොකළ යුතු කරුණු ද වෙයි. අද ලෝකයේ පශ්චාත් උපාධිය දක්වා දෙමළෙන් උගත හැක්කේ ලංකාවේ පමණ ය. තමිල් නාඩුවේ ද ඒ කළ නො හැකි ය. සාමාන්‍ය දෙමළ ජනයාගේ අපේක්ෂා ඉටුකිරීමට පළාත්සභා අවශ්‍ය නො වේ. අවශ්‍යවන්නේ පරිපාලන රෙගුලාසි පැනවීම පමණකි.

ලංකාවේ ප්‍රශ්නය කිසිසේත් ම ඉන්දියාවේ ප්‍රශ්නයට සමාන නො වේ. දඹදිව හෝ භාරතය හෝ කිසි දිනෙක තනි රටක් නො වී ය. ඒ තනි රටක් වූයේ ඉංගිරිසින්ගේ පැමිණීමෙන් පසුව ය. අද ඉංගිරිසින්ගේ ඉන්දියාව අඩුම තරමින් රටවල් තුනකට කැඩී ඇත. ඒ ඉන්දියාව, පකිස්ථානය හා බංග්ලාදේශය යනුවෙනි. ලංකාව එක්සේසත් රාජ්‍යයක් වූයේ මෙරට බහු ජාතික බහු සංස්කෘතික පඬියන් ඉපදීමට අවුරුදු දහස් ගණනකට පෙර ය. ලංකාවේ ඇත්තේ ජාතියක් ගොඩනැගීමේ ප්‍රශ්නයක් නො වේ. පඬුඅබා රජු දවස සිංහල ජාතිය ගොඩනැගීම ඇරඹිණි. ඒ සිංහල ජාතියට ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් ඇතුල් වූ නමුත් සියළු යක්ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතියට එක්වීමට සියවස් ගණනාවක් ගතවිය.

ඉන්දියාවට ජාතිය ගොඩනැගීමේ ප්‍රශ්නය ඇත. අප කිහිප වතාවක් ම සඳහන්කර ඇති පරිදි ඉන්දියාව ඊනියා අනාගමික රාජ්‍යයක් නො වේ. ඒ එසේ නම් සෝනියා ගාන්ධි මහත්මිය හින්දු වීම, සාරි පෙරවීම අවශ්‍ය නො වේ. ඉන්දියාව හින්දු සංස්කෘතිය අධිපතිවාදී සංස්කෘතිය වූ ද හින්දි භාෂාව රාජ්‍ය භාෂාවක් වූ ද (ඉංගිරිසිය ද රාජ්‍ය භාෂාවකි) රටකි. අද එහි හින්දු ආගම, හින්දි චිත්‍රපටි හා ඇතැම් විට ක්‍රිකට් ජාතිය ගොඩනැගීමේ කාර්යයට උර දී

© Prof. Nalin De Silva

ඇත. එහි ඉදිරියෙන් ඇත්තේ ඉන්දීය මධ්‍යම පන්තිය ය. ඉන්දියාවේ අමිතාබ් හච්චන්ගේ උපන්දිනයට ලැබෙන ප්‍රසිද්ධිය මහමත්තුමාගේ උපන්දිනයට නො ලැබෙයි. ප්‍රසිද්ධියේ මොන බොරු කතා කීවත් හින්දු ආගමික උත්සවවලට උතුරු ඉන්දියාවේ සිට දකුණු ඉන්දියාව දක්වා ලැබෙන සැලකිල්ල ඉස්ලාම් ආගමික උත්සවලට නොලැබෙන බව මම අත්දැකීමෙන් ම දනිමි. සමස්ත ඉන්දියාව ම ඉන්දියාවේ හින්දු සංස්කෘතියට ඇති වැදගත්කම පිළිගනියි. එසේ නැතිව ඉන්දීය ජාතියක් හෝ ඉන්දියාවක් හෝ ගොඩනැගිය හැකි නො වේ.

බරක් හුසේන් ඔබාමා මහතා කුඩා කළ ම ක්‍රිස්තියානි නොවන්නට හා පසුව ක්‍රිස්තියානි ඇමරිකාව වෙනුවෙන් කතා නොකරන්නට ඔහුට කිසි දිනෙක ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති වීමට නොහැකි වනු ඇත. ඔහු ඇමරිකන් වටිනාකම් ගැන කතාකරන විට ඒ කතාකරන්නේ ක්‍රිස්තියානි වටිනාකම් ගැන මිස අප්‍රිකාවේ වටිනාකම් ගැන හෝ බෞද්ධ වටිනාකම් ගැන හෝ නොවන බව නොදන්නේ ලංකාවේ බහුජාතික බහුසංස්කෘතික ජඩමාධ්‍යවේදින්, පඬියන් ආදීන් පමණක් විය හැකි ය. අද ඇමරිකාවේ අප්‍රිකන් ඇමරිකන් නමින් හැඳින්වෙන කළු වාර්ගිකයන්ගෙන් ඇතැමෙක් සුදු ඇමරිකන් සංස්කෘතියේ විශේෂිතත්වය පමණක් නොව ආධිපත්‍යය ද පිළිගනිති. විශේෂයෙන් ම ප්‍රභූ විශ්වවිද්‍යාලවල ඉගෙනගත්තෝ ඒ බව පිළිගනිති. මබාමා මහතා හා කොන්ඩලිසා රයිස් මහත්මිය එවැන්නෝ වෙති. ඔබාමා මහතා ඇමරිකන් සුදු සංස්කෘතික ආධිපත්‍යයක් ගැන කතාකරමින් එයට විරුද්ධව තම ජනාධිපතිවරණ ව්‍යාපාරය මෙහෙයවී නම් කුමක් සිදුවීමට තිබුණි ද? ඔහු එසේ කරනු වෙනුවට පසුගිය අප්‍රියෙල් මාසයේ දී චිකාගෝ හි කළු වාර්ගිකයන් හා සම්බන්ධ එක්සත් ත්‍රිත්ව පල්ලියෙන් වෙන්විය. එපමණක් නොව ඔහුගේ සමීපයකු වූ කළු රැඩිකල් පූජකවරයකු වූ ජෙරමියා රයිට් සමග තිබූ සම්බන්ධකම් ද අත්හළේ ය. ඔබාමා මහතා ක්‍රිස්තියානි ආගමිකයකු පමණක් නොව ඉන්පසු කළු ක්‍රිස්තියානි පල්ලි සමග තිබූ සියළු සම්බන්ධකම් අත්හළ ක්‍රිස්තියානි භක්තිකයෙක් විය. මේ අතර පසුගිය දොළොස්වැනි දා නිව්යෝක් ටයිම්ස් පුවත්පතට අනුව වොෂිංටනයේ ස්ටෝලින්ස් නම් කළු කතෝලික පූජකවරයකු වෙන ම ඉමානි (විශ්වාසය යන තේරුම ඇති දකුණු අප්‍රිකානු භාෂාවක් වන ස්වහිලි වචනයකි) නමින් කළු කතෝලික සභාවක් පිහිටුවා ඇත. එහෙත් කළු බිෂොප්වරුන්ගෙන් වැඩි පිරිසක් ඔහුට විරුද්ධ යැයි පැවසෙයි.

මේ සියල්ලෙන් කියැවෙන්නේ ඇමරිකන් ජාතිය ගොඩනැගීමේ දී මුහුණපාන ප්‍රශ්න ය. ඔබාමා මහතා වැන්නන් අමරිකානු ජාතියට ඇතුල්වෙද්දී එයට විරුද්ධ කළු වාර්ගිකයෝ සිටිති. චිත්තරාජලා අර්ධ වෛදික පඬුඅබා සමග එකතුවී  සිංහල ජාතිය ගොඩ නගද්දී ඇතැම් යක්ෂයෝ එයට විරුද්ධ වූහ. අද ලංකාවේ ඇත්තේ දැනටත් නිර්මාණය වී ඇති සිංහල ජාතියට දෙමළ හා මුස්ලිම් ජනවාර්ගිකයන් එකතුකිරීම පිළිබඳ ප්‍රශ්නය ය. එහි දී වැඩි බරක් පැටවෙන්නේ සිංහලයන්ට නොව දෙමළ හා මුස්ලිම් නායකයන්ට ය. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතියේ විශේෂත්වය (ප්‍රමුඛත්වය) පිළිගැනීම, එයට විරුද්ධ නොවීම හා ඒ වෙනුවෙන් පෙනී සිටීම එහි දී ඉතා වැදගත් වෙයි. අපට අවශ්‍ය වන්නේ මධ්‍යයෙහි ශක්තිමත් වූ අනුකලිත (ඉන්ටග්‍රේටඩ්) ජාතියක්, සංයෝගයක් මිස මිශ්‍රණයක් නො වේ. දැනට ඇමරිකාවේ ඔහායෝ ප්‍රාන්තයේ සින්සිනාටා හි වාසය කරන මහාචාර්ය ජානක වංශපුර මහතා පවසන ආකාරයට අපට අවශ්‍ය සම්බෝලයක් මිස සලාදයක් නො වේ. බහුජාතික පඬියෝ සලාදකරුවෝ වෙති. ඔවුහු ඔල්මාදකරුවෝ ද වෙති. දෙමළ ජනවාර්ගිකයකුට සිංහල බෞද්ධ සංස්කෘතියේ ආධිපත්‍යයක් ගැන කියමින් එයට විරුද්ධ ව හා එහි වැදගත්කම නැතිකිරීමට ක්‍රියාකරමින් මෙරට ජනාධිපති විය හැකි යැයි සිතිය හැක්කේ ඔල්මාදකරුවකුට පමණකි.

ඔබාමා මහතා කළු වාර්ගිකයන් පාවා දුන් බව ඇතැම් කළු වාර්ගිකයන් කියනු ඇත. තව අවුරුදු හතරකින් එසේ කියන කළු වාර්ගිකයන් සංඛ්‍යාව වැඩිවනු නොඅනුමාන ය. ඔබාමා මහතා කළු ජනවාර්ගිකයකු අතින් ඝාතනය වීමට වුව ද ඉඩ ඇත. ඒ සියල්ලට හේතුව ඔබාමා මහතාට  සුදු ඇමරිකන් ක්‍රිස්තියානි සංස්කෘතියේ ආධිපත්‍යය යටතේ ක්‍රියාකිරීමට සිදුවීම ය. එහෙත් ඔබාමා මහතාට එසේ ක්‍රියාකිරීම හැර විකල්පයක් නැත. පසුගිය කාලයේ ලක්ෂමන් කදිරගාමර් මහතා සිංහල බෞද්ධ සංස්කෘතියේ විශේෂත්වය පිළිගෙන ක්‍රියා කෙළේ ය. ඔහුට අගමැති වීමේ අවස්ථාව ද විය. එහෙත් මහින්ද රාජපක්ෂ මහතා අගමැති ධුරයට වඩා ප්‍රබල අපේක්ෂයෙක් විය. කදිරගාමර් මහතාට එකල විමල් විරවංශ මහතා ද ඇතුළු ජ වි පෙ සහාය ලුබුණු බව ද අමතක නොකළ යුතු ය. කදිරගාමර් මහතාට අගමැතිකම නැතිවුයේ දෙමළ වූ නිසා නොව මහින්ද රාජපක්ෂ මහතා ප්‍රබල වූ නිසා ය. අද ජාතියට අවශ්‍ය වන්නේ මධ්‍යයේ බලවතුන් විය හැකි කදිරගාමර්ලා මිස ප්‍රාන්ත බලවතුන් වීමට තවමත් දඟලන ආනන්ද සංගරීලා නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva